# "ශිල්ප අභිමානී" 2023

## සිව් වැදෑරුම් නිර්ණායක - ශිල්පකලා සතර පෙර නිමිති (4C)

### C1 අර්ථවත් සංකල්ප Concepts -

අර්ථවත්බව යනු නිර්මාණයක භාවිතාව, අලංකරණමය උපාංග, අමුද්‍රව්‍ය හා තාක්‍ෂණය, සංස්කෘතික, පාරසරික, ජනමූල, ජනකතා, දේශීක දැනුම මත පදනම්ව තිබීම ලෙස හඳුනාගත හැකිය. සංකල්පයක් සෑම විටම අත්කම් ශිල්පකලා නිර්මාණ සඳහා තීරණ ගැනීමට අවශ්‍ය මග පෙන්වන, ඔබ විසින්ම යොදාගන්නා රීති සමුදායකි.

සංකල්ප සඳහා පිවිසුම:

- ඉතිහාසගත තොරතුරු
- පාරිසරික සංකල්ප
- සංරක්‍ෂණ සංකල්ප
- සංස්කෘතික / ආගමික සංකේත නැවත නිර්මාණය
- සම්ප්‍රදාය නූතනත්වයට ගැලපීම
- දේශික දැනුම ප්‍රදර්ශනය

### C2 ශිල්පීයත්වය හසුරු කුසලතාව (කෘතහස්තභාවය) Craftmanship-

පාරම්පරික හෝ පුහුණු ශිල්පීය දැනුම, අමුද්‍රව්‍ය හා තාක්‍ෂණය මනාලෙස උපයෝගී කරගැනීම හා ශිල්පියා සතු විශේෂඥ දැනුම හා කුසලතාව මෙයින් අදහස් වේ.

- අමුද්‍රව්‍ය හා තාක්‍ෂණය තෝරාගැනීම.
- වර්ණ, මතුපිට වයනය, සංකල්ප සහ සම්ප්‍රදායික කරුණු මත සැළකිලිමත් වෙමින් සිදුකරන අවසන් නිමාව.
- කෘතහස්තභාවයඃ ශිල්ප ක්‍ෂේත්‍රයේ දැනුම මනා ලෙස යොදා තිබීම.

### C3 උපයෝගීතාවය හෙවත් භාවිතාව Consumer Resposiveness -

ඔබ කරන නිර්මාණයට පාරිභාරික, සංකේතාත්මක හෝ අලංකරණමය උපයෝගීතාවයක් තිබිය යුතුය. මිනිස් කාර්යයන් පහසුකිරීම සඳහා මානව සාධක සමග ගැලපිය යුතුය.

- උපයෝගිතාවය වර්තමාන එදිනෙදා මිනිස් ක්‍රියාකාරකම් සමග හඳුනාගැනීම.
- ශාරීරික මිනුම්, ක්‍රියාකාරී පරිසරය සහ මනෝභාවික යන මානව සාධක සමග ගැලපීම.
- මිනිස් සංවේදීතාවයන්, සුවඳ, පාට, වයනය, හැඩතල, අමුද්‍රව්‍ය ආදිය ස්පර්ශයේදී ඇතිවන හැඟීම් සමග ගලපාගැනීමට දරන උත්සාහය.
- ස්ත්‍රී පුරුෂ, වයස සහ සංස්කෘතිය අනුව උපයෝගීතාව වෙනස් වීම.
- අමුද්‍රව්‍ය තෝරාගැනීමේදී සෞඛ්‍යමය සාධක සැළකිල්ලට ගැනීම.
- නිවැරදි මිනුම් හා ප්‍රමිතිය.
- කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන භාවිතාව සඳහා අමුද්‍රව්‍ය හා තාක්‍ෂණය යොදාගැනීම.

### C4 සමාජ ආර්ථික වටිනාකම් Cost and Economics

ශිල්පකලා කෘතියක සමාජ ආර්ථික වටිනාකම ශිල්පියාගේත්, ශිල්ප ක්‍ෂේත්‍රයේත් ප්‍රගමනය හා අභිවෘද්ධිය සඳහා ඉවහල්වන වැදගත් නිර්නායකයකි.

ඔබ වැයකරන ප්‍රාග්ධනය, එනම් ධනය ශ්‍රමය හා කාලය ඔබේ නිර්මාණයේ වටිනාකමක් ලෙස පිළිඹිබු විය යුතුය. එය මිල කළ නොහැකි සෞන්දර්යාත්මක හෝ සංස්කෘතික වටිනාකමක් විය හැකිය. එසේ නැතහොත් වෙළඳපල වටිනාකමක්, මිලක් තිබිය යුතුය.

- පිරිවැය ඵලදායී අමුද්‍රව්‍ය තෝරාගැනීම
- අමුද්‍රව්‍ය මුල්කරගත් ශිල්ප සංකල්ප
- වෙළඳපල පිළිබඳ දැනුම
- ශ්‍රමය හා ශක්තිය කළමනාකරණය
- නූතන තාක්‍ෂණය භාවිතයෙන් අමුද්‍රව්‍ය සකසුරුවම්කරණය
- සම්ප්‍රදායික දැනුම නූතන වෙළඳපලට ගැලපීම සඳහා අගයන් එකතු කිරීම (value addition)
- සංකල්පයක්, ආර්ථික වටිනාකමක් බවට පත්කිරීමට දරන උත්සාහය

© 2018 මාර්තු

අදහස හා සැකසුම: සුසිර උඩලමත්ත. කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය.
(ජාතික ශිල්ප සභාව වෙනුවෙන්)